චක්‍රලේඛ අංක :- 02/2019

සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)
අංක 109, හතර වන මහල,
මහ විදිය,
බත්තරමුල්ල.
2019/01/21

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල සහ
අනෙකුත් සියලුම ලියාපදිංචි සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

**සහකාර සාමාන්‍යාධිකාරී III ශ්‍රේණිය - වැ:ප: 102:05**

සියළුම විවිධ සේවා සමුපකාර සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල සහ අනෙකුත් සියලුම ලියාපදිංචි සමුපකාර සමිති සඳහා සහකාර සාමාන්‍යාධිකාරී III ශ්‍රේණිය තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් අනුමත කරන බව කොමිෂන් සභා නියමය පරිදි දන්වමි.

02. මෙම තනතුර සණස සමිති සඳහා අදාල නොවන බව ද කොමිෂන් සභා නියමය පරිදි වැඩිදුරටත් දන්වා සිටිමි.

| | | |
|---|---|---|
| තනතුරේ නම | :- | සහකාර සාමාන්‍යාධිකාරී III ශ්‍රේණිය |
| වැටුප් පරිමාණ අංකය | :- | 102:05 |
| සේවා මට්ටම | :- | කළමනාකරණ |
| අවම වයස් සීමාව | :- | අවුරුදු 24 |
| උපරිම වයස් සීමාව | :- | අවුරුදු 45 |

**තනතුර සඳහා අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්**

(අ) 104:08 වැ.ප. ස්ථිර තනතුරක වසර 08 ක් හෝ 103:07 වැ.ප. ස්ථිර තනතුරක වසර 06 ක් හෝ 102:06 වැ.ප. ස්ථිර තනතුරක වසර 03 ක් හෝ සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

හෝ

(ආ) කළමනාකරණය පිළිබඳ වසරකට නොඅඩු අධ්‍යාපන කාලයක් සහිත සමුපකාර ඩිප්ලෝමාවක් සමත් වීම සමඟ අධීක්ෂණ මට්ටමේ වසර 03 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

එස්.ඒ.එල්.රංගනී,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් :-
01. ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත.
02. ලේකම්, සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය, බස්නාහිර පළාත.
03. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර්, බස්නාහිර පළාත.
04. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්. (කොළඹ, ගම්පහ, කළුතර)
05. අධ්‍යක්ෂක, බස්නාහිර පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය.
06. ලේකම්, මධ්‍යම රජයේ සමුපකාර සේවක කොමිෂන් සභාව.
07. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්.
08. සියළුම වෘත්තීය සමිති සංගම්.